ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජනවාරි 2020

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

---

(AA34) ක්‍රියාවලින්, පාලනයන් සහ විගණනය ප්‍රශ්න පත්‍රය ස්ව-අධ්‍යයන පොත මත පදනම් වූ අනිවාර්ය ප්‍රශ්න නවයකින් යුක්ත විය. ප්‍රශ්න පත්‍රය කොටස් තුනකි; **A කොටස** ලකුණු 5 බැගින් වූ ප්‍රශ්න 4 කින්ද, **B කොටස** ලකුණු 10 බැගින් වූ ප්‍රශ්න 3 කින්ද, **C කොටස** ලකුණු 25 බැගින් වූ ප්‍රශ්න 2 කින්ද වශයෙනි.

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම ස්ව-අධ්‍යයන පොතේ න්‍යාය සහ යෙදුම් මත පදනම් විය. අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පොත අධ්‍යයනය කර තිබුනේනම් සහ ඉකුත් වර්ෂ 5 ට අදාල පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වී තිබුණේනම් ඔවුන්ට ලෙහෙසියෙන්ම මෙම ප්‍රශ්න පත්‍රය සමත්වීමට අවශ්‍ය ලකුණු 50 ට වඩා ලබාගත හැකිව තිබුණි. පරීක්ෂකවරුන්ට පෙනී ගියේ අයදුම්කරුවන් බොහොමයකට විෂය දැනුම තිබුණ නමුත්, විෂය කරුණු මත පදනම්ව උත්තර විධිමත්ව සකස්කර ගැනීමේ පරිචය ඔවුන්ට නොතිබූ බවයි.

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය. ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කල කාලය මැනැවින් කළමනාකරණය කරගෙන සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලියා ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවෝ සිටියහ. කෙසේවෙතත්, අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් අඩු ලකුණු උපයා තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්න සියල්ලටම වාගේ උත්තර ලියා තිබුණේය. කෙසේවෙතත්, තවත් සමහර අයදුම්කරුවන් ඇතැම් කොටස්වලට උත්තර ලියා තිබුණේ නැත. එසේ වී ඇත්තේ දුර්වල කාල කළමනාකරණය, දැනුම නොමැතිකම, ප්‍රශ්න අවබෝධ කර නොගැනීම නිසා බව පෙනේ.

ඉහත දැක්වූ කරුණු හැර, උත්තර පත්‍ර ඇගයීමේදී දක්නට ලැබුණු පොදු නිරීක්ෂණ පහත පරිදි වේ:

- විශ්ලේෂණ කුසලතා අඩුවීම හා භාවිත දැනුම අඩුවීම.
- කියවීමට අපහසු අත් අකුරු.
- වැඩි ලකුණු වෙන්කල ප්‍රශ්න සඳහා කෙටි උත්තර සැපයීම.
- අඩු ලකුණු වෙන්කල ප්‍රශ්නවලට දීර්ඝ උත්තර ලිවීම.
- දී ඇති සිද්ධියට අදාලව විෂය සම්බන්ධ ප්‍රශ්න හඳුනාගෙන තිබූ නමුත් ඊට අනුරූපීව උත්තර ලියා නොතිබීම.
- උත්තර සැලසුම් නොකිරීම සහ අදාල නොවන දේවල් වලින් උත්තර ලියා නිම කිරීම.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති **"කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව"** පිළිබඳ උපදෙස් පිළිනොපැදීම.
- ප්‍රශ්නයෙන් විභාග පරීක්ෂක අපේක්ෂා කළ දැ අවබෝධ කර නොගැනීම.

# <u>A - කොටස</u>

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය මගින් ව්‍යාපාර සංවිධාන වර්ග සහ ව්‍යාපාර පරිසරය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයේ  අවශ්‍යතාවය අවබෝධ කරගත් අතර, මුළු ලකුණු ලබාගෙන තිබුණි.

**(a) කොටස** මගින් උපාධිධාරී මිත්‍රයන් දෙදෙනෙකුට ආරම්භ කළහැකි ව්‍යාපාර සංවිධාන වර්ග හඳුන්වන ලෙස දක්වා ඇත. කෙසේවෙතත්, අයදුම්කරුවන් කිහිප දෙනෙක් උත්තරය වශයෙන් කේවලස්වාමි ව්‍යාපාර දක්වා ඇත. මෙවැනි ව්‍යාපාර මිත්‍රයෝ විසින් ආරම්භ කිරීම සුදුසු නොවන බව මෙම අයදුම්කරුවන් අවබෝධ කරගෙන නොතිබුණි.

**(b) කොටස** මගින් ව්‍යාපාරයට බලපාන ආර්ථික සාධක දැක්වීම අවශ්‍ය කර තිබුණි. නමුත් සමහරක් අයදුම්කරුවන් විසින් දේශපාලනික, නෛතික සහ සමාජීය යන අදාල නැති උත්තර දක්වා තිබුණි.

මෙවැනි ප්‍රශ්න සඳහා සාර්ථක උත්තර සැපයීමට අයදුම්කරුවන්ට පහත අංශ පිළිබඳව දැනුමක් තිබිය යුතුය:

- ව්‍යාපාර සංවිධාන වර්ග.
- ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ. (උදා: අරමුණු, සාමාජිකයන් ගණන, ආදිය)
- ව්‍යාපාරික පරිසරය හඳුනාගැනීම. (අභ්‍යන්තර පරිසරය, බාහිර පරිසරය)
- බාහිර පරිසරයේ බලයන්. (ආර්ථික, නෛතික, තාක්ෂණික, සමාජයීය)
- පරිසරයන්ට බලපෑම් කරන සාධක. (උදා: ආර්ථික බලපෑම් - හුවමාරු අනුපාත, පොලී අනුපාත, බදු)

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය මගින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී යොදාගනු ලබන මූලික මූලධර්මයක් වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. විගණක විසින් විගණන කාලය අතරතුර ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්මට බලපෑම් ඇතිකරන සිදුවීම් / තත්ත්වයන් පිළිබඳව විමසිල්ලෙන් සිටිය යුතුය. එමනිසා ඔවුන්ට අඛණ්ඩ පැවැත්මක් ලෙස අස්තිත්වය නොකඩවා කරගෙන යාමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැක පහළ කෙරෙන මූල්‍ය සිදුවීම් හෝ තත්ත්වයන් පැහැදිලිව හඳුනාගත හැකිවිය යුතුය.

අයදුම්කරුවන් බොහොමයකට අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සැක ඇති කරන සිදුවීම් / තත්ත්වයන් පිළිබඳ අවබෝධයක් තිබුණි. කෙසේවෙතත්, ඔවුන්ට මෙහෙයුම් හා මූල්‍ය සිදුවීම් වෙන්කර හඳුනාගත නොහැකි වූ අතර, ඔවුන්ට වෙන්කළ ලකුණු ලබාගත නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

**(a) කොටස** මගින් ප්‍රමාණාත්මක සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අනාවරණය කර ගැනීමට විගණකගෙන් අපේක්ෂා කළ නොහැකිවන අවස්ථාවන් දක්වන ලෙස ඉල්ලා තිබුණි. මුළු ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන්ට පහත දෑ පිළිබඳව දැනුමක් තිබිය යුතුය:

- සම්බන්ධිත පාර්ශව යනු කුමක්ද?
- සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.
- සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

**(a) කොටස** සඳහා මුළු ලකුණු ලබාගත හැකිවූයේ අයදුම්කරුවන් සුළුතරයකට පමණි. මෙය සෘජුවම ස්ව-අධ්‍යයන පාඩම්මාලාවලින් පරීක්ෂා කර ඇතත්, බහුතරයක් අයදුම්කරුවන්ට ප්‍රමාණවත් දැනුමක් නොතිබුණි.

**(b) කොටස** මගින් සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු විගණනය කිරීමේදී **(a) කොටසින්** දක්වා ඇති අතර, ඒවා හැර අනෙකුත් විගණන පටිපාටි ලැයිස්තුගත කරන ලෙස ඉල්ලා ඇත. කෙසේවෙතත්, අයදුම්කරුවන් ඉහත විගණන පටිපාටින් නැවත ලියා ඇති අතර, සමහරක් සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවලට අදාල සාක්ෂි ලබාගැනීමට අදාල නොවන සාමාන්‍ය විගණන පටිපාටි දක්වා ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මගින් ආයතන මට්ටමින් හා කාර්යභාර විගණනයක් සම්බන්ධයෙන් තත්ත්ව පාලන පටිපාටි පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදි. **(a) කොටස** මගින් කාර්යභාර විගණනයක් සිදුකිරීමේදී "සමාලෝචනය" යටතේ අතුලත් කරනු ලබන ක්‍රියාකාරකම් පරීක්ෂා කර ඇතත්, බොහොමයක් අයදුම්කරුවන් න්‍යායාත්මක දැනුම නොමැති වීමෙන් පහත දැක්වෙන සාමාන්‍ය ක්‍රියාකාරකම් දක්වා ඇත:

- වැඩ පත්‍රිකා නැවත පරීක්ෂාව.
- විගණන වාර්තා අධ්‍යයනය.
- විගණන පටිපාටි නැවත ඉටු කිරීම.
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

**(b) කොටස** මගින් ආයතන මට්ටමින් පවත්වාගෙන යනු ලබන තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග දක්වන ලෙස දක්වා ඇති අතර, අයදුම්කරුවන් බොහොමයක් මුළු ලකුණු ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන් සුළුතරයක් අදාල නොමැති උත්තර සපයා තිබුණි.

මෙමගින් තත්ත්වපාලන ක්‍රියා පටිපාටි සහ එහි මූලිකාංග පිළිබඳ දැනුම අල්ප බව පෙනුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## B - කොටස

### ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මගින් භාවිත කරන්නන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා, මතයක් ප්‍රකාශ කිරීම සඳහා අදාල විගණන සාක්ෂිවල ස්වභාවය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී.

**(a) කොටස** මගින් ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කිරීම අපේක්ෂා කර ඇත.

ප්‍රමාණවත්භාවය යනු සාක්ෂිවල ප්‍රමාණය වන අතර, යෝග්‍ය බව යනු සාක්ෂිවල ගුණාත්මකභාවයයි. අයදුම්කරුවන් බොහොමයක් සාර්ථක ලකුණු ලබාගෙන තිබූ නමුත් සුළුතරයක් අයදුම්කරුවන්ට නියමිත අදහස පැහැදිලි කිරීමට නොහැකි විය.

බහුතරයක් අයදුම්කරුවන් අදාල නොමැති කරුණු ඉදිරිපත් කර තිබූ අතර, සමහරෙක් ප්‍රශ්නයේ දී තිබූ විස්තර නැවත උත්තර වශයෙන් ලියා තිබුණි.

**(b) කොටස** මගින් සහතිකවීමේ කාර්යභාරයක් බාර ගැනීමේදී හා අඛණ්ඩව කරගෙන යාමේදී ඉටුකළ යුතු ප්‍රධාන අවශ්‍යතාවයන් පැහැදිලිකරන ලෙස දක්වා තිබුණි. විගණක විසින් කළ යුතු පියවර බොහොමයක් ස්ව-අධ්‍යයන පාඩම්මාලා මගින් විස්තර කර ඇති නිසා බොහොමයක් අයදුම්කරුවන් පියවරයන් බොහොමයක් ඉදිරිපත් කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 06

මෙමගින් **සීමාසහිත සාරා ට්‍රේඩිං සමාගමේ** අදාල වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විගණන මතය කෙරෙහි ඉහත දැක්වූ කරුණුවල බලපෑම විස්තර කරන ලෙස දක්වා තිබුණි. **සීමාසහිත සාරා ට්‍රේඩිං සමාගම** විසින් කාර්යාල ගොඩනැගිල්ලේ මාස 3 කට අදාල රු. මිලියනයක් වන ක්ෂය ගිණුම්වලට ගෙන නොතිබුණි. මෙය ප්‍රමාණාත්මකභාවය වන රු. මිලියන 1.7 ක් ඉක්මවා නැත.

**සීමාසහිත සාරා ට්‍රේඩිං සමාගම,** ලාභා'ලාභ ගිණුමට හර කළ යුතුව තිබූ රු. මිලියන 1.5 ක ණය පිරිවැය ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසුවත් ප්‍රාග්ධනිත කර තිබුණි. මෙම අගයන් ප්‍රමාණවත් බව ඉක්මවා ගොස් නැත. කෙසේවෙතත්, ඉහත අවප්‍රකාශන දෙකම සැලකිල්ලට ගත්විට, එය මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණවත් වේ.

කෙසේවෙතත්, සුළුතරයක් අයදුම්කරුවන් පිරිසක් පමණක් මූල්‍ය බලපෑම පාදක කරගෙන බලපෑම තක්සේරු කරගෙන තිබුණි. තාක්ෂණික දැනුම උපයෝගී කරගෙන දී ඇති ප්‍රායෝගික අවස්ථාවකට අදාලව නිවැරදි මතයකට පැමිණීමේදී අයදුම්කරුවන්ගේ දැනුමේ අල්ප බව දක්නට ලැබේ.

**(b) කොටස** ඍජු ප්‍රශ්නයක් වන අතර, න්‍යායාත්මක දැනුම පරීක්ෂා කර තිබුණි. ප්‍රමාණාත්මක සහ යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි වන්නේනම්, ප්‍රකාශ කළ යුතු විගණන මතයේ වර්ග හඳුන්වන ලෙස දක්වා ඇත. කෙසේවෙතත්, ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වීමෙන් තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශයක් කළ යුතු බව සුළුතරයක් අයදුම්කරුවන් විසින් සඳහන් කළත් ඔවුන්ගෙන් බහුතරයක් ව්‍යාවනය කළ මතය පිළිබඳ සැලකිල්ලක් දක්වා නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 07

**(A) කොටස** මගින් යම්කිසි ආයතනයක් දැනට සිටින විගණක ඉවත් කිරීමේදී අනුගමනය කළ යුතු පටිපාටි සහ නව විගණකයෙක් විසින් නව පත්වීම බාරගැනීමෙන් පසු ඉටුකළ යුතු පටිපාටි පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. මෙය සෘජුවම ස්ව-අධ්‍යයන පාඩම්මාලාවලින් පරීක්ෂා කර ඇත.

දැනට සිටින විගණකයෙක් ඉවත් කිරීම හා නව විගණක පත් කිරීම සම්බන්ධව ඇති (a) සහ (b) කොටස සඳහා කාර්යසාධනය ඉතා දුර්වල විය. (a) **කොටස** සඳහා බොහොමයක් අයදුම්කරුවන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම, කොටස්කරුවන්ට දැනුම්දීම, සමාගම් රෙජිස්ට්‍රාර්ට දැනුම්දීම වැනි අදාල නැති උත්තර සපයා තිබුණි.

**(B) කොටස** මගින් වෘත්තිය ගණකාධිකාරිවරුන්ට රහස්‍ය තොරතුරු අනාවරණය කිරීමට අවශ්‍ය විය හැකි අවස්ථා සඳහන් කරන ලෙස දක්වා තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි උත්තරය සපයා තිබුණි. කෙසේවෙතත්, පහත සඳහන් අදාල නොමැති උත්තරද සපයා තිබුණි,

- මූල්‍ය ප්‍රකාශනවල ඇති අවප්‍රකාශන හඳුනාගත් විට.
- සම්බන්ධිත පාර්ශව සමඟ ඇති ගනුදෙනු සම්බන්ධව අදාල ආයතන සම්බන්ධ වී ඇති විට.
- කුමන හෝ හානියකින් ආයතනය ආරක්ෂා කිරීමට.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

# <u>C - කොටස</u>

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය දෙන ලද සිද්ධිදාමයකට අදාලව සංයුක්ත පාලනය (Corporate Governance), අභ්‍යන්තර පාලනයන්, පාලන පරිසරය හා තොරතුරු තාක්ෂණ පාලනයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද ප්‍රශ්නයකි.

### <u>(a) සහ (b) කොටස</u>

(a) සහ (b) **කොටස** මගින් සංයුක්ත පාලනය සහ එහි මාර්ගෝපදේශයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදි.

(a) **කොටස** මගින් සංයුක්ත පාලනයට අනුව අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කළ යුතු මාර්ගොපදේශයන් පැහැදිලිව දැක්වීමට හැකිවී තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකට පමණි. බොහෝ අසාර්ථක අයදුම්කරුවන් අධ්‍යක්ෂකවරුන්ට හා කළමනාකරුවන්ට අදාල පහත සඳහන් කාර්යයන් සඳහන් කර තිබුණි,

- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- ගැනුම්, විකුණුම් හා තොග සම්බන්ධ පාලනයන්.
- කාර්යය විභජනය.

(b) **කොටස** මගින් සංයුක්ත පාලන මාර්ගෝපදේශ අනුව පිහිටවිය යුතු කමිටු පිළිබඳව දැනුම පරීක්ෂා කරන ලදි. බහුතරයක් අයදුම්කරුවන් එක් කමිටුවක් පමණක් සඳහන් කරන ලදි.

සුළුතරයක් අයදුම්කරුවන් වංචා වැළැක්වීමේ කමිටුව, ගැනුම් කමිටුව, විකුණුම් කමිටුව හා කළමනාකරණ කමිටුව යනාදී අදාල නැති උත්තර සපයා ලකුණු ලබාගෙන නොතිබුණි.

**(c) සහ (d) කොටස**

**(c)** සහ **(d) කොටස** සඳහා කාර්යසාධනය සාර්ථක මට්ටමක පැවතුණි. මෙම ප්‍රශ්නය මගින් මිලදීගැනීමේ ක්‍රියාවලියේ ශක්තීන් 8 ක් දී තිබූ අතර, ඉන් 5 ක් සඳහන් කරන ලෙසත්, **(d) කොටස** මගින් එක් එක් ශක්තීන් සඳහා අරමුණ බැගින් දක්වන ලෙසත් අයදුම්කරුවන්ට උපදෙස් දී තිබුණි. බහුතරයක් අයදුම්කරුවන්ට මේ සඳහා ඉහළ ලකුණු ලබාගත හැකිවී තිබුණි. ප්‍රශ්නය මගින් කරුණු දී ඇති නිසා අයදුම්කරුවන්ට ඔවුන්ගේ මූලික දැනුම යොදාගෙන මුළු ලකුණු ලබාගත හැකිවිය.

**(e) කොටස**

**සීමාසහිත HL හොටේල්ස් පොදු සමාගමේ** පිහිටවිය යුතු පාලන පරිසරයේ මූලිකාංග සහ පාලන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. මෙම කොටස සඳහා ලකුණු ලබාගැනීමට අයදුම්කරුවන්ට අදාල විෂය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. පාලන පරිසරයේ මූලිකාංග හා පාලන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම අඩු නිසා මෙම කොටස සඳහා කාර්යසාධනය දුර්වල විය. බොහොමයක් අයදුම්කරුවන් අදාල නොමැති උත්තර ලියා තිබුණි.

**(f) කොටස**

බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා උත්තර ලියා තිබුණු අතර, දත්ත ගොනුවලට අනවසර සංශෝධනය කිරීම් වැළැක්වීම සඳහා පොදු පාලනයන් ලැයිස්තුගත කර තිබුණි. සාමාන්‍ය අයදුම්කරුවන් පිරිසක් පමණක් යෙදවුම්වල නිවැරදිතාවය පිළිබඳ පාලනය කිරීම සඳහා තිබෙන භාවිත පාලනයන් ලැයිස්තුගත කර තිබුණි.

අවශ්‍යකරන දක්ෂතාවයක් නොමැති අයදුම්කරුවන් පොදු පාලනයන් හා භාවිත පාලනයන් පිළිබඳ වෙනස සැලකිල්ලට නොගෙන තොරතුරු තාක්ෂණයට අදාල පාලනයන් සඳහන් කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

**(a) කොටස**

විගණනයක් සඳහා නිසි සැලසුමක් අවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු සඳහන් කරන ලෙස ප්‍රශ්නය මගින් අවශ්‍ය කර ඇත.

**(b) කොටස**

**සීමාසහිත ශ්‍රිනා ෆැබ්රික්ස් පොදු සමාගම** පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රභවයන් 5 ක් ලැයිස්තුගත කරන ලෙස දක්වා තිබුණි.

මේ සඳහා කාර්යසාධනය සාමාන්‍ය තත්ත්වයක පැවතිය නමුත් සුළුතරයක් අයදුම්කරුවන් **"(c) කොටසට"** අදාල කරුණු මේ සඳහා උත්තර වශයෙන් සපයා තිබුණි.

සමහරක් අයදුම්කරුවන් ඔවුනට විෂය මූලික දැනුම නොමැති වුවත් ප්‍රශ්නයේ දී තිබූ ප්‍රභවයන් උත්තර වශයෙන් ලියා සැලකිය යුතු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

අසාර්ථක උත්තර සැපයූ බොහොමයක් අයදුම්කරුවන් **සීමාසහිත ශ්‍රිනා ෆැබ්රික්ස් පොදු සමාගම** පිළිබඳ අවබෝධය ලබාගත හැකි ප්‍රභවයන් ලෙස උපකාරක ලියවිලි හා ලෙජරය සඳහන් කර තිබුණි.

**(c) කොටස**

ප්‍රශ්නයේ මෙම කොටසින් විගණන පටිපාටි ඉටුකිරීමේදී **සීමාසහිත ශ්‍රිනා ෆැබ්රික්ස් පොදු සමාගමේ** විශේෂ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර 6 ක් හඳුන්වන ලෙස දක්වා තිබුණි.

ප්‍රශ්නයේ දී ඇති තොරතුරු අනුව ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා අයදුම්කරුවන්ට තිබිය යුතු මූලික දැනුම විභාග පරීක්ෂක විසින් අපේක්ෂා කර තිබුණි. (බොහොමයක් ක්ෂේත්‍ර ණයගැතියන්ට අදාල ඒවා විය.)

කාර්යසාධනය දුර්වල මට්ටමක විය.

ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නය හරිහැටි අවබෝධ කර නොගැනීමෙන් ව්‍යාපාරය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට අදාල ක්ෂේත්‍ර වන ව්‍යාපාරයේ ස්වභාවය, නෛතික හා අනෙකුත් බාහිර සාධක, අභ්‍යන්තර පාලනයන්, අරමුණු හා උපායමාර්ග හා අදාල ව්‍යාපාරික අවදානම්, ගණකාධිකරණ ප්‍රතිපත්ති තේරීම හා යොදාගැනීම ආදිය උත්තර වශයෙන් සඳහන් කර තිබුණි.

**(d) කොටස**

මෙමගින් ණයගැතියන්ගේ ශේෂය විගණනයේදී ඉටුකළ යුතු විගණන පටිපාටි ලැයිස්තුගත කරන ලෙස දක්වා තිබුණි. විෂය මූලික දැනුම සමඟ ප්‍රයෝගික යෙදවුම් පිළිබඳ දැනුම ඇති සාර්ථක අයදුම්කරුවන්ට සතුටුදායක මට්ටමක ලකුණු ලබාගත හැකිවුණි.

සමහරක් අසාර්ථක අයදුම්කරුවන් ප්‍රශ්නය වැරදි ලෙස අවබෝධ කරගෙන ණයගැතියන් කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු පටිපාටි ලෙස ණය අයකර ගැනීම ඉක්මන් කිරීම සඳහා වට්ටම් ලබාදීම, කාල සීමාව අඩු කිරීම හා ප්‍රතිපාදන යෙදීම යනාදිය උත්තර වශයෙන් ලියා තිබුණි.

**(e) කොටස**

විගණන සාක්ෂි ලබාගැනීමේදී විගණන පටිපාටි වර්ග පැහැදිලි කරන ලෙස දක්වා තිබූ මෙම ප්‍රශ්නයට බහුතරයක් අයදුම්කරුවන් පහසුවෙන් මුළු ලකුණු ලබාගෙන තිබුණි.

සමහරක් අයදුම්කරුවන් නිරීක්ෂණය හා පරීක්ෂාව විස්තර කිරීමේදී අපහසුතාවයකට මුහුණ දී තිබුණි.

සුළුතරයක් අයදුම්කරුවන් පහත සඳහන් අදාල නැති උත්තර සපයා තිබුණි:

- පාලන පරීක්ෂාව / විස්තරාත්මක පරීක්ෂාව / සවිස්තරාත්මක විගණන පටිපාටි.
  (මේවා පුළුල් මට්ටමේ විගණන පටිපාටි වන අතර, විගණන පටිපාටි වර්ග නොවේ).
- වාචික සාක්ෂිවලට වඩා ලිඛිත සාක්ෂි විශ්වසනීයත්වයෙන් වැඩිය, ආදිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් වර්ෂ 5 ක ප්‍රශ්න වලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙළ කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට එලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -